**ගලෙන්බිදුණුවැව ප්‍රාදේශීය සභාව - 2023**
**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ගලෙන්බිදුණුවැව ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ගලෙන්බිදුණුවැව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දැන්වීම් පුවරු ආදායම් බිල්කිරීම රු.126,500 ක් වුවත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ එය රු.63,350 ක් ලෙස අඩුවෙන් දක්වා තිබුණි. | පිළිගන්නා බව. | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | යන්ත්‍ර කුලී ආදායම් බිල්කිරීම් රු.200,975 ක් වුවත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ එය රු.220,795ක් ලෙස වැඩියෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | 2022 වර්ෂයේ අත්පත් කරගත් වත්කම් 02 කට අදාළව සමාලෝචිත වර්ෂයේදී ක්ෂය රු.36,682 ක් ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | ක්ෂය ප්‍රතිපත්තියට අනුකූලව ක්ෂයවීම් ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | ස්ථාවර තැන්පත් ගිණුමකට අදාළව සමාලෝචිත වර්ෂය සඳහා රු.44,897 ක ලැබිය යුතු පොලී ආදායමක් ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | සංක්‍රාන්ති දිනෙන් පසු මිලදීගත් වත්කම්වලට අදාළ ක්ෂය රු.51,579 ක් ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | ක්ෂය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාතර්ා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවක වැටුප් හා වේතන ප්‍රතිපූර්ණ වටිනාකම විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය අනුව රු.18,414,108 ක් වුවත් පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රතිපූර්ණ පත්‍රිකා අනුව එය රු.19,195,165 ක් වුයෙන් රු.781,057 ක වෙනසක් විය. | පිළිගන්නා බව. | උපලේඛන අනුරූපී වාර්තා සමඟ සැසඳිය යුතුය. |
| (ආ) | 2023 දෙසැම්බර් 31 දිනට ආදායම් විෂයයන් 04 කට අදාළව විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ දක්වා තිබූ වටිනාකම හා ඊට අදාළ උප ලේඛනවල සඳහන් වටිනාකම අතර රු.214,348 ක වෙනසක් විය. | -එම- | -එම- |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂය | මුදල<br>රු. | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|---|
| ජලනල තොග | 3,452,403 | මෙම තොගය තුළ නොතිබුණු භාණ්ඩ වර්ග 03 ක වටිනාකම ඉවත් නොකර මෙම තොග වටිනාකම් සඳහන් කිරීම | පිළිගන්නා බව. | තහවුරු කිරීම් ඉදිරිපත් කළ යුතුය. |
| පදික වෙළඳාම | 232,400 | පදික වේදිකා පොල ලේඛනය | -එම- | -එම- |
| සතිපොල ගාස්තු | 3,400,300 | සතිපොල ගාස්තු අයකිරීම් ලේඛනය - 2023 | -එම- | -එම- |
| සූර්යය ජලනල ආදායම | 94,974 | වාර්ෂික ආදායම් ලේඛනය | -එම- | -එම- |
| විනෝද බද්ද සිනමා | 147,500 | විනෝද බදු අයකිරීම් ලේඛනය | -එම- | -එම- |
| විවිධ තැන්පතු | 20,000 | විස්තර සඳහන් ලේඛන | -එම- | -එම- |
| කොන්ත්‍රාත් තැන්පතු | 17,789 | -එම- | -එම- | -එම- |
| සතිපොල රථගාල් ආදායම් | 105,000 | -එම- | -එම- | -එම- |
| වෙනත් තැන්පතු | 1,654,506 | -එම- | -එම- | -එම- |
| ජල සැපයුම් ණය හිමි | 479,194 | -එම- | -එම- | -එම- |
| නොගෙවූ විශ්‍රාම වැටුප් | 689,653 | -එම- | -එම- | -එම- |
| මුද්දර | 558,128 | -එම- | -එම- | -එම- |
| ලැබුණු ප්‍රාග්ධන වියදම් ප්‍රදාන | 8,233,389 | -එම- | -එම- | -එම- |
| දේපළ පිරියත හා උපකරණ මිලට ගැනීම් | 5,089,500 | -එම- | -එම- | -එම- |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) 1958 අංක 29 දරන සත්ව ආඥා පනත | | | |
| (i) 2 (2) වගන්තිය | සභා බල ප්‍රදේශයේ අවශ්‍යතාවයට පමණක් හරක් මස් සැපයීම සඳහා කරකොළවැව පෞද්ගලික ස්ථානයක පවත්වාගෙන යන සෝ ගාතකාගාරයකට සභාව අවසරය ලබාදී තිබුණු නමුත් පොලිස් නිලධාරීන් දෙදෙනෙකුගේද පූර්ණ ආරක්ෂාව සහිතව එහි එළදෙනුන්, අවුරුදු 12 ට අඩු පැටවුන් සහ මී ගවයින් ද ඝාතනය කිරීම් සිදුකර තිබුණි. | පිළිගන්නා බව. | සභා බල ප්‍රදේශයේ ගව මස් අවශ්‍යතාවට පමණක් සෝගාතකාගාරයේ කටයුතු සිදුවන බවට සභාවේ ලේකම් විසින් වගබලාගත යුතුය. |
| (ii) 2 (2) වගන්තිය | කරකොළවැව සෝගාතකාගාරයේ මස් පරීක්ෂා කිරීම සිදුකරන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් ඉදිරිපත් කර තිබූ වාර්තාව අනුව එළ ගවයින් 30 දෙනෙකු ඝාතනය කරන බවට සඳහන් කර තිබුණු නමුත් මී ගවයින් 30 දෙනෙකු ඝාතනය කර තිබුණි. | -එම- | සත්ව ආඥා පනතට අනුකූලව කටයුතු සිදුවිය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ වියදම රු.9,439,884 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ වියදම රු.25,424,762 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තු ගත ආදායම | 2023 බිල් කළ ආදායම | 2023 රැස්කළ ආදායම | 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2022 ඇස්තමේන්තු ගත ආදායම | 2022 බිල් කළ ආදායම | 2022 රැස්කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 2,656,827 | 2,644,393 | 2,574,711 | 5,533,458 | 2,656,827 | 2,702,644 | 2,922,213 | 5,463,776 |
| (ii) | කුලී | 10,142,350 | 6,057,105 | 6,346,250 | 1,440,660 | 10,142,350 | 6,471,310 | 5,473,490 | 1,729,805 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 820,000 | 1,074,080 | 1,042,080 | 408,500 | 820,000 | 779,250 | 576,500 | 376,500 |
| (iv) | වෙනත් ආදායම් | 17,494,300 | 18,446,883 | 14,676,128 | 7,939,952 | 17,494,300 | 10,233,633 | 14,477,380 | 4,169,197 |
| | | 31,113,477 | 28,222,461 | 24,639,169 | 15,322,570 | 31,113,477 | 20,186,837 | 23,449,583 | 11,739,278 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| (i) | සමාලෝචිත වර්ෂයේ වරිපනම් බිල් කිරීම රු.1,863,099 ක් වූ නමුත් එයින් සියයට 50 ක් වූ රු.929,720 ක් අයකරගෙන නොතිබුණු අතර 2023 ජනවාරි 01 දිනට පැවති රු.5,107,976 ක හිඟ වරිපනම් වලින් සමාලෝචිත වර්ෂයේදී රු.823,934 ක් පමණක් අයකර ගෙන තිබුණි. | පිළිගන්නා බව. | අයකර ගැනීමට ක්‍රියාකළ යුතුය. |
| (ii) | 2023 දෙසැම්බර් 31 දින වනවිට හිඟ ව්‍යාපාර බදු රු.412,200 ක් අයකරගෙන නොතිබුණි. | -එම- | -එම- |
| (ආ) | **කුලී** | | |
| (i) | සභාවට අයත් කඩ කාමර 32 ක් වෙනුවෙන් පුද්ගලයන් 18 දෙනෙකුගෙන් අයවිය යුතු කඩ කාමර කුලිය රු.367,010 ක් වසර 1 ත් 15 ත් අතර කාලයක සිට අයකරගෙන නොතිබුණි. | -එම- | -එම- |
| (ii) | සභාව සතු යන්ත්‍ර කුලියට ලබාදීම වෙනුවෙන් පුද්ගලයන් 07 දෙනෙකුගෙන් අයවිය යුතු රු.421,850 ක් වසර 02 ක කාලයක සිට අයකරගෙන නොතිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (iii) | සභාව සතු වත්කම් 05 ක් බදුදීම වෙනුවෙන් අයවිය යුතු රු.651,800 ක් වසර 02 ක කාලයක සිට අයකරගෙන නොතිබුණි. | පිළිගන්නා බව. | අයකර ගැනීමට ක්‍රියාකළ යුතුය. |
| (ඇ) | **බලපත්‍ර ගාස්තු** | | |
| | 2021 සිට 2023 වර්ෂය දක්වා කාලය වෙනුවෙන් පුද්ගලයන් 47 දෙනෙකුගෙන් අයවිය යුතු රු.408,500 ක බලපත්‍ර ගාස්තු අයකරගෙන නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | **වෙනත් ආදායම්** | | |
| | ජල පාරිභෝගිකයන් 417 දෙනෙකුගෙන් අයවිය යුතු හිඟ ජල ගාස්තු රු.109,232 ක් සහ ජල සම්බන්ධතා ගාස්තුව රු.140,172 ක් 2023 දෙසැම්බර් 31 දින වනවිට අයකරගෙන නොතිබුණි. | -එම- | -එම- |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය හැකිව තිබූ නමුත් 2023 දෙසැම්බර් 31 දින වනවිටත් එම කාරණා වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | පිළිගන්නා බව. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| ගලෙන්බිඳුණුවැව පුස්තකාලයට අයත් වටිනාකම රු.14,341 ක් වූ පොත් 51 ක් අස්ථානගතවී තිබුණු නමුත් එයට වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | එම පොත් වලින් 03 ක් ලැබී ඇති බව හා ඉතිරි පොත්වල වටිනාකම නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කරන බව. | අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| සතිපොළ භූමියේ පැරණි කඩ කාමර 10 ක් අලුත්වැඩියා කර ආකර්ශනීය පෙනුමක් සහිතව සකස් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබීම නිසා නිෂ්කාර්යව පැවතුණි. | මෙම කඩ කාමර LDSP ව්‍යාපෘතියේ අරමුදලින් අලුත්වැඩියා කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කර ඇති බව. | අලුත්වැඩියා කර බදුදීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| ගෝසාතකාගාරය සඳහා පරිසර බලපත්‍රයක් මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිකුත් කර තිබුණු නමුත් එම බලපත්‍රයේ සඳහන් කොන්දේසිවලට පටහැනිව ඝාතනය කරන සතුන්ගේ ලේ සහිත ජලය හිස් සහ ඉතිරි කොටස් විවෘත භූමිය වෙත සෘජුව බැහැර කරන බව නිරීක්ෂණය විය. | පිළිගන්නා බව. | බලපත්‍ර කොන්දේසිවලට අනුව කටයුතු සිදුවන බවට සභාවේ ලේකම් වගබලාගත යුතුය. |